# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත

---

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: රු. 2.85 යි   තැපැල් ගාස්තුව: රු. 1.50 යි

# පටුන


වගන්තිය | පිටුව

1. ලුහුඬු නාමය ... ... ... ... ... 1

I වන පරිච්ඡේදය

පිරිවැටුම් බදු පැනවීම

2. පිරිවැටුම් බදු පැනවීම ... ... ... ... ... 1
3. තැනැත්තකු පිරිවැටුම් බදු අය කරනු ලැබිය හැකි බවට පත් වන අවස්ථා ... ... 1

II වන පරිච්ඡේදය

නිදහස් කිරීම

4. පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම ... ... ... ... 2

III වන පරිච්ඡේදය

පිරිවැටුම

5. පිරිවැටුම ... ... ... ... ... ... 2
6. වෙනස් ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු බව ... ... ... 4

IV වන පරිච්ඡේදය

බදු අනුප්‍රමාණ

7. පිරිවැටුම් බදු අනුප්‍රමාණය ... ... ... ... ... 4
8. බැහැර කරනු ලැබූ දේ ... ... ... ... ... 5

V වන පරිච්ඡේදය

වාර්තා

9. වාර්තා හා තොරතුරු සැපයිය යුතු බව ... ... ... ... 5

VI වන පරිච්ඡේදය

බදු ගෙවීම

10. පිරිවැටුම් බද්ද ගෙවීම ... ... ... ... ... 7
11. ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය ... ... ... ... 7

VII වන පරිච්ඡේදය

පිටරට සාදනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ මත
පිරිවැටුම් බදු පැනවීම සහ එකතු කර ගැනීම

12. පිටරට සාදනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ මත පිරිවැටුම් බද්ද පැනවීම සහ ඒ බද්ද එකතු කර ගැනීම ... ... ... ... ... 8


2—ඒ 58274—15,250 (81/10)

VIII වන පරිච්ඡේදය

තක්සේරු කිරීම

වගන්තිය

පිටුව

13. තක්සේරු කිරීමට තක්සේරුකරුට ඇති බලය ... ... ... ... 8
14. අතිරේක තක්සේරුව ... ... ... ... ... 10
15. වාර්තාවක් පිළිනොගැනීම පිළිබඳව තක්සේරුකරු හේතු දක්විය යුතු බව ... ... 10
16. විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමට තක්සේරුකරුට ඇති බලය ... ... 10

IX වන පරිච්ඡේදය

අභියාචනා

17. කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචනා ... ... ... 10
18. සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන කිරීම ... ... ... 13
19. නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන ... ... 13

X වන පරිච්ඡේදය

තක්සේරුවල නිශ්චිත භාවය සහ වැරදි වාර්තා සඳහා දඩුවම

20. තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව ... ... 13
21. පිරිවැටුම් බද්ද අඩුවෙන් ගෙවීම සඳහා දඩුවම ... ... ... 13

XI වන පරිච්ඡේදය

විශේෂ අවස්ථා

22. අශක්‍යතාවට පත් තැනැත්තකු වෙනුවෙන් කවරකු විසින් ක්‍රියා කළ හැකි ද යන බව ... 14
23. හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව ... ... 14
24. සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියාකළ යුතු බව ... 14
25. ව්‍යාපාරය අවසන් වන අවස්ථාවේ දී පිරිවැටුම් බද්ද ගෙවීමේ වගකීම ... ... 15
26. පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා පොල්මඃකරු සතු වගකීම ... ... ... 15
27. තමන්ට අයත් නොවන ව්‍යාපාර සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම ... ... ... ... ... 16
28. ඒකාබද්ධ අනුයෝජිතයන්, භාරකරුවන් හා පොල්මඃකරුවන් ... ... 16
29. සමාගමක් ඇවර කිරීමේ දී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේ දී පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන තැනැත්තන් ... ... ... ... ... 16

XII වන පරිච්ඡේදය

බදු අයකර ගැනීම

30. 31 වන වගන්තියේ සිට 38 වන වගන්තිය දක්වා වගන්තිවල කාර්ය සඳහා පිරිවැටුම් බද්දේ අර්ථය 17
31. පිරිවැටුම් බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව ... ... ... ... 17
32. පැහැර හරින්නා වෙත කරනු ලබන දැන්වීම ... ... ... ... 17
33. තහනම් කොට විකිණීමෙන් පිරිවැටුම් බද්ද අයකර ගැනීම ... ... ... 18
34. අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය ... ... 19
35. ණය ආදියෙන් පිරිවැටුම් බද්ද අය කර ගැනීම ... ... ... ... 20
36. ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් පිරිවැටුම් බදු අය කර ගැනීම ... ... 22
37. බදු අය කර ගැනීමේ මාර්ග මගින් එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම ... ... 23
38. පිරිවැටුම් බදු අය කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය ... ... ... ... ... 23
39. කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම ... ... ... 23

## XIII වන පරිච්ඡේදය

### විවිධ කරුණු

වගන්තිය — පිටුව

40. දන්වීම් අත්සන් කිරීම හා භාරදීම ... ... ... ... 23
41. තක්සේරුවල වලංගු භාවය ... ... ... ... 24
42. ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය ... ... ... 25
43. ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කිරීමට ඇති බලය ... ... ... ... 26
44. පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින් ම වවුවරය පිළියෙළ කොට නිකුත් කළ යුතු බව 27
45. ගනුදෙනු පිළිබඳ ලේඛනය ... ... ... ... ... 27

## XIV වන පරිච්ඡේදය

### සාදන්නන් ලියාපදිංචි කිරීම

46. සාදන්නා ලියා පදිංචි කිරීම හා ඔහු විසින් වවුවර නිකුත් කිරීම ... ... ... 27
47. ලියාපදිංචි කළ සාදන්නා විසින් කරනු ලබන අඩු කිරීම ... ... ... 28
48. ප්‍රධාන රේගු අයකැමි වෙත ගෙවන ලද පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැර ... ... 29
49. වැඩිපුර ගෙවන ලද පිරිවැටුම් බද්ද ආපසු ගෙවිය යුතු බව ... ... ... 29

## XV වන පරිච්ඡේදය

### ගෙවීම්වලින් පිරිවැටුම් බද්ද අඩු කිරීම

50. ගෙවීම් වලින් පිරිවැටුම් බද්ද අඩු කිරීම ... ... ... ... 31

## XVI වන පරිච්ඡේදය

### වැරදි සහ දණ්ඩන

51. රහස්‍යතාව කඩ කිරීම හා වෙනත් කාරණා වැරදි වන බව ... ... ... 33
52. වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන ... ... ... ... 33
53. වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන ... ... ... ... 34
54. වැරදි සමථයට පත් කිරීම ... ... ... ... ... 35
55. නඩු පැවරීම කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව ... ... 35

## XVII වන පරිච්ඡේදය

### පරිපාලනය

56. පරිපාලනය ... ... ... ... ... ... 35
57. නිල රහස්‍යතාව ... ... ... ... ... 35
58. ආකෘති පත්‍ර සහ ගනුදෙනු පිළිබඳ ලේඛනය ... ... ... ... 37

## XVIII වන පරිච්ඡේදය

### අර්ථ නිරූපණය

59. අර්ථ නිරූපණය ... ... ... ... ... 37

## XIX වන පරිච්ඡේදය

### 1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටස අදාළ වීම

60. 1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටස අදාළ වීම ... ... ... 41

එල්. ඩී.—ඕ. 41/80.

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 12 වන දින]

**පිරිවැටුම් බදු පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන පරිච්ඡේදය

### පිරිවැටුම් බදු පැනවීම

2. (අ) ශ්‍රී ලංකාවේ යම් ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ; හෝ පිරිවැටුම් බදු පැනවීම.

(ආ) ශ්‍රී ලංකාවෙන් ගෙවීම කරනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත සේවාවන් ඉටු කරන්නා වූ

සෑම තැනැත්තකුගෙන්ම, 1981 නොවැම්බර් මස 13 වන දින සිට 1981 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය සඳහා සහ 1982 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම කාර්තුවක් සඳහාම (මෙහි මින් මතු "පිරිවැටුම් බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ව්‍යාපාරයෙන් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ඉටු කරන ලද සේවාවලින් හෝ ඒ තැනැත්තා විසින් කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව අ ගණනය කරනු ලැබූ බද්දක්, මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව අය කරනු ලැබිය යුතු ය.

මේ පනතේ කාර්ය සඳහා "ව්‍යාපාරය" යන යෙදුමෙහි ශ්‍රී ලංකාවෙන් ගෙවීම කරනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත ඉටු කරන ලද සේවාවන් ඇතුළත් විය යුතු ය.

3. (1) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ කර ගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් විසිපන් දහසකට අඩු නොවේ නම් සහ, ඒ ව්‍යාපාරය යම් කාර්තුවක කොටසක් සඳහා පමණක් ඔහු විසින් කර ගෙන යනු ලබන අවස්ථාවක, කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම, කාර්තුවේ ඒ කොටසෙහි දින ගණන අනුව දරන අනුපාතය ම යම් මුදල් ප්‍රමාණයක් රුපියල් විසිපන් දහසකට දරන්නේ ද ඒ මුදල් ප්‍රමාණයට වඩා වැඩි වේ නම්, ඒ එක් එක් කාර්තුව සඳහා පිරිවැටුම් බද්දක් අය කරනු ලැබිය යුතු ය. තැනැත්තකු පිරිවැටුම් බදු අය කරනු ලැබිය හැකි බවට පත් වන අවස්ථා.

(2) තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඔහුගෙන් පිරිවැටුම් බදු අය කරනු ලැබිය හැකි හා ඒ ව්‍යාපාරයේ අයිතියක වෙනස්වීමක් සිදුවන අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, ඒ ව්‍යාපාරයේ නව අයිතිකරු අයිතිය වෙනස්වීම සිදුවීමට පෙරාතුව ම ඒ ව්‍යාපාරයේ අයිතිකරු වී සිටියාක් මෙන් සලකා ඒ ව්‍යාපාරයේ නව අයිතිකරුගෙන් පිරිවැටුම් බදු අය කළ යුතු ය.

## II වන පරිච්ඡේදය

### නිදහස් කිරීම

පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම.

4. (1) අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය බව තමාගේ මතය වේ නම්, ගැසට් පත්‍රයේ පළ කරන නියමය මගින්, යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් හෝ නිශ්චිත වශයෙන් දක්වනු ලබන ව්‍යාපාරයක් හෝ පිරිවැටුම් බද්දෙන් නිදහස් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි සිට හෝ ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු අතර, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත හෝ, ඒ කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත්, ඒ කාලසීමාව ඉකුත් වීමෙන් පසුව පවත්වනු ලබන පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමේ දී හෝ ඒ නියමය අනුමත කරන ලෙසට වූ යෝජනාවක් මගින් ඒ නියමය පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන එනු ලැබිය යුතු ය.

(3) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් නියමයක්, ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින තෙක් ඒ නියමයේ වලංගු භාවයට හානියක් නොමැතිව ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සලකනු ලැබිය යුතු අතර, ඒ නියමය යම් දිනයක දී ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සැලකෙන්නේ ද ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## III වන පරිච්ඡේදය

### පිරිවැටුම

පිරිවැටුම.

5. (1) මේ පනතේ කාර්යය සඳහා යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට "පිරිවැටුම" යන්නෙන් ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඊළඹුණු ගණුදෙනුවලින් හෝ ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී ඉටුකරන ලද සේවා සඳහා හෝ ලබා ගන්නා ලද හෝ ලබා ගත හැකි මුළු මුදල් ප්‍රමාණය අදහස් වන අතර, "පිරිවැටුම" යන්නට—

(අ) ආයෝජකයකු, මුදල් ණයට දෙන්නකු හෝ බඩු උකස් ගන්නකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් ණය වෙනුවෙන් ලබාගන්නා ලද හෝ ලබාගත හැකි පොලිය හා ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් වශයෙන් ඔහු විසින් ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණයත් ඇතුළත් වේ ;

(ආ) යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාඨශාලාවක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව පවත්වාගෙන යාමේ දී ඔහු විසින් ලබා ගන්නා ලද හෝ ලබාගත හැකි මුළු මුදල් ප්‍රමාණය ඇතුළත් වේ ;

(ඈ) රක්ෂණ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් ලබා ගන්නා ලද හෝ ලබාගත හැකි, වාර මුදල් හැර මුළු මුදල් ප්‍රමාණය ඇතුළත් වේ;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද ද්‍රව්‍ය ආනයනකරුවකු සම්බන්ධයෙන් වන විට—

(1) ඒ ද්‍රව්‍ය ආනයනය කරන ලද අවස්ථාවක—

(අ) තීරුබදු ආඥාපනත අනුව තීරුබද්දේ කාර්යය සඳහා නිශ්චය කරන ලද ඒ ද්‍රව්‍යවල වටිනාකම; හා

(ආ) ඒ ද්‍රව්‍ය වෙනුවෙන් යම් තීරුබද්ද ගෙවන ලද්දේ නම් ඒ තීරුබදු ප්‍රමාණය

ඇතුළත් වේ;

(2) ඒ ද්‍රව්‍ය විකුණන ලද්දේ නම් ලබා ගන්නා ලද හෝ ලබා ගත හැකි මුදල් ප්‍රමාණය ඇතුළත් වේ;

(ඉ) වෙනත් භාණ්ඩයක් සෑදීමේ කාර්යය සඳහා සාදන්නකු විසින් වෙනත් සාදන්නකුට කරනු ලබන විකිණීමක් සම්බන්ධයෙන් වන විට, යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන්, ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද වශයෙන් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් එකතු කිරීමට ප්‍රථම, ලබාගන්නා ලද හෝ ලබාගත හැකි මුදල් ප්‍රමාණය ඇතුළත් වේ;

(ඊ) බැංකුවක් සම්බන්ධයෙන් වන විට, පොලී, වට්ටම්, ලාභාංශ, විනිමය, සේවා ගාස්තු, කොමිස් සහ බ්‍රෝකර් ගාස්තුව වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ ඒ බැංකුවේ ලැබීම් සහ ඒ බැංකුවේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී හෝ වෙනත් ආකාරයකින් හෝ ඒ බැංකුව විසින් උපයා ගන්නා ලද වෙනත් යම් ආදායමක් ඇතුළත් වන්නේ ය. එසේ නමුත් ඒ බැංකුවේ විදේශ මුදල් බැංකු ඒකකය පවත්වාගෙන යාමට අදාළ කළ හැකි ලැබීම් ඊට ඇතුළත් නොවිය යුතු ය.

මේ ඡේදයේ "විදේශ මුදල් බැංකු ඒකකය" යන්නෙන් විදේශ මුදල් බැංකු ඒකකයක් වශයෙන් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙන ලද වෙළෙඳ බැංකුවක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ;

(උ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවාවන් ඉටු කරන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ සේවාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් ලබා ගන්නා ලද හෝ ලබාගත හැකි මුදල් ප්‍රමාණ ඇතුළත් වේ.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා පිරිවැටුමට, මූලධන වත්කම් විකිණීමෙන් ලබාගන්නා ලද හෝ ලබාගත හැකි යම් මුදල් ප්‍රමාණයක් ඇතුළත් නොවිය යුතු ය.

(3) යම් කාර්තුවක් සම්බන්ධයෙන් ඒ කාර්තුව ඇතුළත ලබා ගත හැකි යම් මුදල් ප්‍රමාණයක් සඳහා පිරිවැටුම් බද්ද ගෙවන ලද අවස්ථාවක ඒ මුදල් ප්‍රමාණය නියම වශයෙන් ලබාගන්නා ලද්දේ යම් කාර්තුවක් ඇතුළත ද ඒ කාර්තුව සම්බන්ධයෙන් ඒ මුදල් ප්‍රමාණය සඳහා කිසිම බද්දක් ගෙවනු ලැබීම අවශ්‍ය නොවේ.

වෙනස් ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු බව.

6. (1) තැනැත්තකු විසින් සමාන ස්වභාවයක ව්‍යාපාර එකම ස්ථානයක හෝ වෙනස් ස්ථානවල පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක, ඔහු විසින් පවත්වාගෙන යනු ලබන ඒ ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු ය.

(2) එකම තැනැත්තා විසින් එක් ස්ථානයක පවත්වාගෙන යනු ලබන වෙනස් ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු ය.

## IV වන පරිච්ඡේදය

### බදු අනුප්‍රමාණ

පිරිවැටුම් බදු අනුප්‍රමාණය.

7. (1) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දේ අනුප්‍රමාණය ඒ ව්‍යාපාරයේ ස්වභාවය අනුව නිශ්චය කරනු ලැබීම ද, ඒ අනුව වෙනස් ව්‍යාපාරවල පංති හෝ වර්ග සම්බන්ධයෙන් ඒ බද්දේ වෙනස් ප්‍රමාණ නිශ්චය කිරීම ද ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීම ද කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යම් ව්‍යාපාර පංතියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් පිරිවැටුම් බදු ප්‍රමාණය කලින් කල වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සෑම නිශ්චය කිරීමක් ම හා (2) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක් ම එය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයෙහි හෝ ඒ නිශ්චය කිරීමෙහි හෝ නියමයෙහි නියම කරනු ලැබිය හැකි පසු දිනයක බලාත්මක විය යුතු අතර, ඒ නිශ්චය කිරීම හෝ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයේ සිට තුන් මසක කාලසීමාවක් ඇතුළත හෝ ඒ කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත් ඒ කාලසීමාව ඉකුත්වූ පසු පවත්වනු ලබන පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමේ දී ඒ නිශ්චය කිරීම හෝ නියමය අනුමත කරනු ලැබීමට යෝජනාවකින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි සෑම යෝජනාවක උපලේඛනයක ම යෝජනාවෙහි සඳහන් කරනු ලබන්නේ යම් නිශ්චය කිරීමක් හෝ නියමයක් ද, ඒ නිශ්චය කිරීමෙහි හෝ නියමයෙහි පෙළ දක්වනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ (1) වන උපවගන්තිය යටතේ යම් නිශ්චය කිරීමක් හෝ (2) වන උපවගන්තිය යටතේ යම් නියමයක් හෝ ඒ යටතේ කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොවන පරිදි, ඒ ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය. එවැනි යම් නිශ්චය කිරීමක් හෝ නියමයක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

8. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ නියමයෙහි නියමිත යම් දෙයක් මේ පනතේ කාර්ය සඳහා බැහැර කරන ලද දෙයක් ලෙස ප්‍රකාශ කළ හැකිය. වෙනස් දේ ව්‍යාපාරවල වෙනස් පංති හෝ වර්ග සම්බන්ධයෙන් බැහැර කරන ලද දේ ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. බැහැර කරනු ලැබූ දේ.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් දෙයක් යම් ව්‍යාපාර පංතියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් බැහැර කරන ලද දෙයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, ඒ භාණ්ඩය විකිණීමෙන් හෝ ඒ භාණ්ඩය ආනයනය කිරීම සම්බන්ධයෙන් ලබා ගන්නා මුදල් ප්‍රමාණය වෙනුවෙන් කිසිම පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු නො වන්නේ ය.

## V වන පරිච්ඡේදය

### වාර්තා

9. (1) ශ්‍රී ලංකාවෙහි යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන සෑම තැනැත්තකුම විසින් යම් කාර්තුවක් සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් විසිපන්දහසකට අඩු නොවන හා, ඔහු විසින් ඒ ව්‍යාපාරය යම් කාර්තුවක කොටසක් සඳහා පමණක් කරගෙන යන අවස්ථාවක, කාර්තුවේ ඒ කොටස සඳහා ව්‍යාපාරයේ පිරිවැටුම් යම් මුදලක් කාර්තුවේ ඒ කොටස තුළ දින ගණන අනුවකට දරන එම අනුප්‍රමාණයට රුපියල් විසිපන් දහසට දරන්නේ ද එම මුදලට වඩා අඩු නොවන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්තුව හෝ කාර්තුවේ කොටස ඉකුත් වී දින පහළොවක් පසුවීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ කාර්තුව හෝ කාර්තුවේ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම දැක්වෙන වාර්තාවක් සපයනු ලැබිය යුතු ය. එවැනි සෑම වාර්තාවක් ම නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතු අතර, ඒ ආකෘති පත්‍රයෙහි සඳහන් කළ යුතු යයි නියම කරනු ලබන සියලු විස්තර ඇතුළත් විය යුතු ය. වාර්තා හා තොරතුරු සැපයිය යුතු බව.

(2) තක්සේරුකරුවකු විසින් ඔහුගේ විනිශ්චය පරිදි පිරිවැටුම් බදු අය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත තක්සේරුකරුට අවශ්‍ය විය හැකි විස්තර ඇතුළත් වාර්තාවක් සපයන ලෙස විධාන කළ හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබාගැනීමේ කාර්යය සඳහා තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමකින්—

(අ) ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවීම් තුණ්ඩු, විගණක වාර්තා හෝ ඔහු සන්තකයෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් යම් ලේඛන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට හෝ තක්සේරුකරු වෙත යැවීමට ;

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පිරිවැටුම පිළිබඳ පරීක්ෂා කරනු ලැබීමේ කාර්යය සඳහා දැන්වීමේ සඳහන් යම් ස්ථානයකට යම් දිනයක හා යම් වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණීමට

නියම කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ කාර්ය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමකින්—

(අ) ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක් පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ ඔහු සන්තක යෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් ලේඛන ඉදිරි පත් කිරීමට හෝ ඒ නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත යැවීමට;

(ආ) ඒ දැන්වීමේ සඳහන් යම් කරුණක හෝ කරුණු පිළිබඳ ඔහු පරීක්ෂා කරනු ලැබීම සඳහා දැන්වීමේ සඳහන් යම් ස්ථානයකට යම් දිනයක හා යම් වේලාවක තමා ම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණීමට

නියම කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් ප්‍රකාර පැමිණෙන යම් තැනැත්තකුට එසේ පැමිණීමෙන් ඔහු විසින් සංධිරණට දරන ලද වියදම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනු මත කරනු ලැබිය හැකි ය.

(6) (3) වන උපවගන්තිය යටතේ හෝ (4) වන උපවගන්තිය යටතේ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ අනුමැතිය ඇතිව තක්සේරුකරුවකු විසින් හෝ තමා වෙත වෙන් කරනු ලැබ තිබෙන හෝ ඉදිරිපත් කරනු ලබන හෝ ප්‍රේෂණය කරනු ලැබ තිබෙන හෝ ප්‍රේෂණය කරනු ලබන හෝ වෙනත් ආකාරයකින් තම සන්තකයට පත්වන හෝ පත්ව තිබෙන හෝ යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක් පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලියකියවිලි මේ පනතේ කාර්ය සඳහා තම භාරයෙහි යම් කාලයක් සඳහා රඳවා ගැනීමට අවශ්‍ය වන්නේ ද ඒ කාලය සඳහා තම භාරයෙහි රඳවා ගනු ලැබිය හැකි ය.

(7) තක්සේරුකරුවකු විසින් අවශ්‍ය යයි තමා අදහස් කරන විටක සහ විටින් විට යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්—

(අ) පරිපූර්ණ හෝ වැඩිමනත් වාර්තා; හෝ

(ආ) තක්සේරුකරුගේ අදහස පරිදි ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු පිරිවැටුම් බද්ද තක්සේරු කිරීමෙහි ලා අවශ්‍යවන්නා වූ හෝ අදාළ වන්නා වූ යම් කාරණයක් පිළිබඳව වඩාත් පරිපූර්ණ හෝ වැඩිමනත් තොරතුරු

ඒ නිවේදනයෙහි නියමිත කාලය තුළ සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(8) යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ පනත යටතේ සපයනු ලැබිය යුතු යැයි සලකනු ලබන වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක් අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ සපයන ලද බවට සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර ඊට පටහැනිව කරුණු ඔප්පු කරන්නේ නම් මිස, එවැනි යම් වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක් අත්සන් කරන යම් තැනැත්තකු ඒ වාර්තාවේ, ප්‍රකාශයේ හෝ ආකෘතියේ ඇතුළත් සියලු කරුණු පිළිබඳ දැනීම ඇති බවට සලකනු ලැබිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

### බදු ගෙවීම

**10.** යම් කාර්තුවක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඒ කාර්තුව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පසු දිනයක් නොවන දිනක ගෙවිය යුතු ය. එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ යම් බද්දක් එක් තැනැත්තකුට වැඩි දෙනකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය. පිරිවැටුම් බද්ද ගෙවීම.

**11.** (1) යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ගෙවීම පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන්— ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය.

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) ගෙවීම පැහැර හැර ඇති යම් මුදලක් ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක ගෙවීම පැහැර හැර තිබෙන කාල සීමාවේ එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි පහළොස් වන දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව වෙනුවෙන් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක්

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවනු ලැබිය යුතු මුළු මුදල, ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් සියයට පනහක් කවර අවස්ථාවක දී හෝ නොඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදු වී ඇති යම් විශේෂ කාරණා හේතු කොට ගෙන ඒ මුදල අත් හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැර දැමීම හෝ අඩු කිරීම කළ හැකි ය.

(2) 17 වන වගන්තිය යටතේ අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීම මත (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ මුදල් එකතු කරන ලද යම් පැහැර හරින ලද බද්දක් අඩු කරන ලද විටක ඒ මුදල හෝ මුදල් එසේ අඩු කරන ලද බද්ද මත ගණන් බැලිය යුතු ය.

## VII වන පරිච්ඡේදය

### පිටරට සාදනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ මත පිරිවැටුම් බදු පැනවීම සහ එකතු කර ගැනීම

පිටරට සාදනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ මත පිරිවැටුම් බද්ද පැනවීම සහ ඒ බද්ද එකතු කර ගැනීම.

12. (1) මේ පනතේ කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක් ආනයනය කරන සෑම තැනැත්තකු ගෙන් යම් කාර්තුවක් සඳහා වූ පිරිවැටුම 3 වන වගන්තියේ සඳහන් මුදලට වඩා වැඩි වුව ද නුවුව ද ඔහුගේ පිරිවැටුම සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දක් 7 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක සඳහන් අනුප්‍රමාණ අනුව අයකර ගනු ලැබිය යුතු අතර ප්‍රධාන රේගු අයකැමි විසින් ඒ බදු එකතු කරනු ලැබිය යුතු ය. තවද ඒ පිරිවැටුම් බද්ද රේගු ආඥාපනත යටතේ පනවා අය කරගනු ලබන වෙනත් යම් බද්දකට, තීරු ගාස්තුවකට හෝ ගාස්තුව කට අමතරව විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් පිරිවැටුම් බද්ද, ඒ බද්ද පැනවීමේ සහ එකතු කර ගැනීමේ කාර්ය සඳහා, රේගු ආඥාපනත යටතේ පනවනු ලැබිය හැකි තීරු ගාස්තු ලෙස සැලකිය යුතු ය. ඒ අනුව, ඒ බද්ද පැනවීමට, එකතු කර ගැනීමට සහ අයකර ගැනීමට, ඒ බද්දෙන් නිදහස් කිරීමට හෝ ඒ බද්ද අස්කර ගැනීමට සහ ඒ බද්දට අදාළ යම් අභියාචනයක් හෝ වෙනත් යම් කාරණයක් නිරවුල් කිරීමට රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩයක්—

(අ) රේගු ආඥාපනත යටතේ අයකර ගැනීමට ඇති යම් ගාස්තු වක් සඳහා ප්‍රධාන රේගු අයකැමි විසින් ;

(ආ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත යටතේ අයකර ගැනීම් සඳහා ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ;

(ඇ) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින්

විකුණන ලද අවස්ථාවක, ඒ භාණ්ඩ මිල දී ගන්නා මේ පනතේ කාර්ය සඳහා ආනයනකරු ලෙස සැලකිය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

### තක්සේරු කිරීම්

තක්සේරු කිරීමට තක්සේරුකරුට ඇති බලය.

13. (1) යම් තැනැත්තකුගෙන්—

(අ) තක්සේරුකරුගේ අදහස පරිදි පිරිවැටුම් බදු අයකරගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් 9 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා වාර්තාවක් සැපයීමට සහ ඒ කාර්තුව සඳහා ඒ බද්ද ගෙවීමට අපොහොසත් වන්නා වූ විටක, හෝ

(ආ) පිරිවැටුම් බද්ද අයකර ගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් 9 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් වාර්තාවක් සපයන නමුත් එම කාර්තුව සඳහා බද්ද ගෙවීමට අපොහොසත් වන විටක

ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින්, තක්සේරුකරුගේ විනිශ්චය අනුව ගෙවිය යුතුව තිබුණ පිරිවැටුම් බද්දේ ප්‍රමාණය තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ඒ මුදල වහා ම ගෙවන ලෙස ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ යුතු ය. යම් තැනැත්තකු සම්බන්ධයෙන් කාර්තුවක් සඳහා එසේ තක්සේරු කරන ලද මුදල 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ලෙස සැලකිය යුතු ය:

එසේ වුවද, තක්සේරුකරුගේ අදහස පරිදි, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිට වී යාමට ආසන්න බව නැතහොත් ආදායම් ආරක්ෂා කර ගැනීම සඳහා එවැනි යම් කාර්තුවක අවසානයෙන් පසුව එළඹෙන පහළොස්වන දිනයට පෙර යම් අවස්ථාවක දී ඒ කාර්තුව සඳහා යම් තැනැත්තකු තක්සේරු කිරීම අවස්ථාවෝචිත වන විටක හෝ යම් කාර්තුවක අවසානයෙන් පසුව එළඹෙන පහළොස්වන දිනට පෙර යම් අවස්ථාවක දී ඒ කාර්තුව සඳහා යම් තැනැත්තකු තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර 10 වන වගන්තිය යටතේ නියමිත කාලයට පෙර ඒ බද්ද කොමසාරිස් ජනරාල්වරයාට ගෙවීමට නියම කරනු ලැබිය හැකි ය. එසේ නොගෙවන ලද යම් බද්දක් ඒ කාර්තුව සඳහා ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සැලකිය යුතු ය.

(2) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවකින් ඒ තක්සේරු කරන ලද මුදල එම කාර්තුව සඳහා ඔහුගෙන් අයවිය යුතු පිරිවැටුම් බදු මුදල වූවාක් සේ සලකා 11 වන වගන්තිය යටතේ දණ්ඩනයකට ඒ තැනැත්තාගේ බැඳීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය.

(3) යම් කාර්තුවක් සම්බන්ධයෙන් 9 වන වගන්තිය යටතේ වාර්තාවක් නොසපයන ලද තැනැත්තකු විසින් ඒ කාර්තුව සඳහා ගෙවන ලද පිරිවැටුම් බදු මුදල තක්සේරුකරුගේ මතය අනුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු නියම මුදලට වඩා අඩු වූ විටක තක්සේරුකරුගේ විනිශ්චය අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන දිනයකට පෙර, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

(4) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා පිරිවැටුම් බද්ද වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ඒ කාර්තුව සඳහා ගෙවීම පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතු ය. ඒ අනුව 10 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා 11 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ, ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

**අතිරේක තක්සේරුව.**

**14.** (1) පිරිවැටුම් බද්ද අයකළ හැක්කේ යම් තැනැත්තකු ගෙන්ද, ඒ තැනැත්තා විසින්, යම් කාර්තුවක් සඳහා බද්ද විශයෙන්, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය හැකි හෝ ඒ කාර්තුව සඳහා අයකර ගත හැකි නියම මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක්, ගෙවනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, තක්සේරුකරුවකු විසින් යම් අවස්ථාවක දී තක්සේරුකරුගේ විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් බද්ද ගෙවනු ලැබිය යුතුව තිබුණේ යම් අතිරේක මුදල් ප්‍රමාණයකට ද ඒ අතිරේක මුදල් ප්‍රමාණය එකී තැනැත්තාගෙන් අයවිය යුතු ලෙස තක්සේරු කරනු ලැබිය හැකි ය. තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත තක්සේරු කිරීමේ දැන්වීමක් දෙනු ලැබිය යුතු ය.

(2) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක එසේ තක්සේරු කරන ලද මුදල ඒ කාර්තුව සඳහා නොගෙවා පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතු ය. ඒ අනුව 10 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා 11 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

**වාර්තාවක් පිළිනොගැනීම පිළිබඳව තක්සේරුකරු හේතු දක්විය යුතු බව.**

**15.** යම් තැනැත්තකු විසින් 9 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සපයන ලද වාර්තාවක්, තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා 13 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් වාර්තාව පිළිනොගැනීමට හේතු තැපැලෙන් යවන ලද ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැන්විය යුතු ය.

**විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමට තක්සේරුකරුට ඇති බලය.**

**16.** යම් භාණ්ඩයක් සාදනු ලබන ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තකු ඒ භාණ්ඩ බෙදා හැරීමේ කාර්ය සඳහා යම් මිලකට විකුණනු ලබන අවස්ථාවක, තක්සේරුකරුගේ මතය අනුව ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු පිරිවැටුම් බද්ද අඩු වන විට හෝ අඩුවිනු ලබන්නා වූ විටක මේ පනතේ කාර්ය සඳහා ඒ භාණ්ඩය එසේ විකුණනු ලැබූ දිනම තක්සේරුකරුගේ මතය පරිදි, විවෘත වෙළෙඳ පොළේ විකුණන ලද විට ඊට ලැබෙන්නා වූ මිලට විකුණන ලද සේ සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ තැනැත්තාගේ ඒ ව්‍යාපාරයෙහි පිරිවැටුම ආගණනය කරනු ලැබිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

### අභියාචනා

**කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචනා.**

**17.** (1) මේ පනත යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරුකරුවකු විසින් කරන ලද යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද දණ්ඩනයක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තා අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තක්සේරුව, අතිරේක තක්සේරුව හෝ දණ්ඩනය පිළිබඳ දැන්වීම භාරදීමේ

දිනයට පසු දින තිහක් ඇතුළත ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට හෝ දණ්ඩනයට විරුද්ධව ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකි ය. අභියාචනය කරනු ලැබුව ද මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය:

එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුරවීම හෝ වෙනත් යුක්තිසහගත හේතුවක් නිසා අභියාචකට ඒ කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) සෑම අභියාචනයක්ම කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ අභියාචනයට හේතු එහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව, වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද විටෙක නිසියාකාරව පිළියෙල කරන ලද වාර්තාවක් සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන සෑම අභියාචන පෙත්සමක්ම වලංගු නොවිය යුතු ය.

(5) වලංගු අභියාචනා පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින්, තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩිදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචනා පෙත්සමෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේ දී එකඟ වීමකට එළඹුණහොත් තක්සේරුව අවශ්‍ය පරිදි සකස් කර ගත යුතු ය.

(6) (5) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචක සහ තක්සේරුකරු අතර එකඟ වීමක් ඇති නොවූ අවස්ථාවක, අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ යුතු ය.

(7) සෑම අභියාචකයකු ම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතු ය. පුද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ අභියාචකට අභියාචන විභාගයට පෙනී සිටිය හැකි ය. අභියාචනයක විභාගය අඩාලව කල්තැබීම සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා කල්පනා කරන්නේ නම්, තමා විසින් නියම කරනු ලබන වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස ඔහු විසින් අභියාචනයක විභාගය කලින් කල අඩාලව කල් තැබිය හැකි ය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාලව කල් තැබිය හැකි අතර, අභියාචනය විනිශ්චය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ

නම්, අඩාලව කල් තැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පුද්ගලිකව පැමිණ සිටිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අභියාචනයේ විභාගය සඳහා හෝ යම් අඩාලව කල් තැබූ විභාගයක් සඳහා හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් නැතහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලිකව පැමිණ සිටීමට අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත අභියාචක විසින් ඒ අභියාචනයේ විභාගයේ දී හෝ අඩාලව කල් තැබූ යම් අභියාචනයක විභාගයක දී ඔහු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම වළක්වනු ලැබූ යේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකි ය.

(8) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයාට තිබිය යුතු අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්තිසහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකි ය.

(9) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එසේ කිරීම අවශ්‍ය යයි සලකත හොත්, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූ ද එම දැන්වීමෙහි නිශ්චය කරනු ලබන්නා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධනපත්‍ර, පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, චෙක් පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව ඇතුළත, පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවන ලෙස හෝ එම තැනැත්තාට නියම කළ හැකි ය.

(10) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(11) මේ වගන්තිය යටතේ අභියාචනයක් නිශ්චය කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින්, අභියාචනා කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ නිශ්චය කිරීම පිළිබඳව අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

18. 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලය වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචන කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනවලට අදාළ ඒ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ වන අභියාචනයකට අදාළ විය යුතු ය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන කිරීම.

19. (1) සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතුය :

එසේ වුවද, අභියාචනාධිකරණයේ මතය සඳහා නීති ප්‍රශ්නයක් ගැන කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) අභියාචනාධිකරණය වෙත හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට අදාළ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ අභියාචනයකට අදාළ විය යුතු ය.

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන.

## X වන පරිච්ඡේදය

### තක්සේරුවල නිශ්චිතභාවය සහ වැරදි වාර්තා සඳහා දඩුවම

20. පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ පනතේ නියමිත කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක හෝ ඒ බද්දේ ප්‍රමාණය අභියාචනයේ දී, නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක හෝ අභියාචනයේ දී, අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද හෝ තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය :

එසේ වුවද, මේ පනතේ කිසිවකින්, යම් කාර්තුවක් සඳහා අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නේ නම් ඒ කාර්තුව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙන් තක්සේරුකරුවකු වලක්වනු නොලැබිය යුතු ය.

තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව.

21. යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවක දී, පිරිවැටුම් බද්දේ ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත පිරිවැටුම සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය ලෙස ඔහු විසින් දැනටමත් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ ද, තක්සේරුව 20 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ තැනැත්තා විසින් ස්වකීය පිරිවැටුම එළිදරව් කිරීමේ දී වංචාවක් හෝ ඕනෑකමින් පැහැර හැරීමක් සිදු වී නොමැති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි සනාථ කරනු ලබන්නේ නම්

පිරිවැටුම් බද්ද අඩුවෙන් ගෙවීම සඳහා දඩුවම.

මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙළ කිරීම සඳහා දඬුවම වශයෙන්, රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුව කරන ලද්දේ යම් පිරිවැටුමක් මත ද ඒ පිරිවැටුම හා ස්වකීය වාර්තාවේ නියමිත පිරිවැටුම අතර වන වෙනස මත වන බද්ද මෙන් දෙගුණය කට සමාන මුදලක් ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

## XI වන පරිච්ඡේදය

### විශේෂ අවස්ථා

අශක්‍යතාවට පත් තැනැත්තකු වෙනුවෙන් කවරකු විසින් ක්‍රියාකළ හැකි ද යන බව.

22. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අශක්‍යතාවට පත් තැනැත්තකු නම්, ඒ අශක්‍යතාවට පත් තැනැත්තා ගේ භාරකරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව.

23. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, හවුල් ව්‍යාපාරයක දී තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින විට, ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ දැනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ කොටස්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ ඔහු සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියා කළ යුතු බව.

24. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ පනතේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ය:

එසේ වුවද සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ පනත යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමඟ තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරනහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනු දැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍ය

වල ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියලු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උදේ‍යාගයෙන් තමා ක්‍රියා කල බව ඔප්පු කරතහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

ව්‍යාපාරය අවසන් වන අවස්ථාවේ දී පිරිවැටුම් බද්ද ගෙවීමේ වගකීම.

25. (1) මින් මතු සලසා ඇති විධිවිධානවලට යටත්ව, කාර්තුවක් තුළ දී, පිරිවැටුම් බද්ද අය කළ හැකි වූ තැනැත්තකු, ඒ බද්ද අය කළ හැකිවනුයේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරය අවසන් කරන අවස්ථාවක, ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණ ද, ඒ කාර්තුව තුළ දී ඔහු ඒ ව්‍යාපාරය පවත්වාගෙන ගිය කාල සීමාව සඳහා ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටිය යුතු ය.

(2) ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යාපාරය වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ පැවරුමට පෙරාතුව වූ කාල සීමාව සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්ද ඒ බද්ද පැවරුම්කරුගෙන් අය කර ගත නොහැකි නම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද පැවරුම්ලාභිගෙන් අය කර ගත හැකි වන අතර, පිරිවැටුම් බද්ද එකතු කිරීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා පොල්මෑකරු සතු වගකීම.

26. (1) පිරිවැටුම් බද්ද අයකළ හැකි වූ යම් තැනැත්තකු මිය යන අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුව වූ සියලුම කාලසීමාවන් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කළ හැකි වූ පිරිවැටුම් බද්ද ඒ තැනැත්තාගේ පොල්මෑකරුගෙන් අය කරනු ලැබිය යුතු වන අතර, ඒ මිය ගිය තැනැත්තා, ජීවත්ව සිටියේ නම් මේ පනත යටතේ වගකිව යුතු වූ සියලු ක්‍රියා, කාරණා හා දේවල් සම්බන්ධයෙන් වගකිව යුතු ය :

එසේ වුව ද,—

(අ) මිය ගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මෑකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය ;

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදුවූ දිනයට පෙරාතුව වූ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන්, මරණය සිදු වූ කාර්තුවේ අවසානයේ සිට තුන් අවුරුද්දකට පසුව, කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය ; සහ

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මෑකරුගේ වගකීම—

(i) මේ වගන්තිය යටතේ පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නඟින බවට පොල්මෑකරුට දැන්වීම දෙනු ලබන දිනය වන විට ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ පාලනයෙහි පැවැති මිය ගිය තැනැත්තාගේ මුදලේ ප්‍රමාණයට ; සහ

(ii) අර්ථලාභියකු අතට පත්ව තිබිය හැකි ඒ මුදලයේ යම් කොටසක ප්‍රමාණයට

සීමා විය යුතු ය.

(2) පොල්මෑකරුවකු විසින්, මිය ගිය තැනැත්තකුගේ බූදලය වෙනුවෙන් ඒ බූදලයේ කොටසක් වන යම් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක ඒ මිය ගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කර ගත හැකිව තිබුණු පිරිවැටුම් බද්ද, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන්, ඒ පොල්මෑකරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

තමන්ට අයත් නොවන ව්‍යාපාර සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම.

27. පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු යම් ව්‍යාපාරයක් යම් තැනැත්තකු විසින් යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ අනුයෝජක වශයෙන් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන්, මේ පනත යටතේ පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකළ යුතු ආකාරයටම හා ප්‍රමාණයටම, පිරිවැටුම් බද්ද අය කරගත යුතු ය.

ඒකාබද්ධ අනුයෝජිතයන්, භාරකරුවන් හා පොල්මෑකරුවන්.

28. තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ මිය ගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මෑකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ පනත යටතේ ඔවුන්ගෙන් අය කළ හැකි වන පිරිවැටුම් බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකිවන අතර, ඒ බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

සමාගමක් ඈවර කිරීමේ දී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේ දී පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන තැනැත්තන්.

29. (1) සමාගම් ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, සමාගමක් අවසන් කරනු ලබන අවස්ථාවක හා ඒ සමාගම විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අයකර ගත නොහැකි වූ අවස්ථාවක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකුම, බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දළ නොසැලකිල්ලකට, ව්‍යතික්‍රමයකට හෝ යුතුකම් පැහැර හැරීමකට පැවරිය නොහැකි බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් වගකිව යුතු වන අතර, පිරිවැටුම් බද්ද එකතුකර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක හා ඒ පුද්ගල මණ්ඩලය විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අයකරගත නොහැකි වූ අවස්ථාවක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුම, බද්ද ගෙවීම පැහැර හැරීම, ඒ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දළ නොසැලකිල්ලකට, ව්‍යතික්‍රමයකට හෝ යුතුකම් පැහැර හැරීමකට පැවරිය නොහැකි බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් වගකිව යුතු වන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

## XII වන පරිච්ඡේදය

### බදු අයකර ගැනීම

30. (1) 31 වන වගන්තියේ, 32 වන වගන්තියේ, 33 වන වගන්තියේ, 34 වන වගන්තියේ, 35 වන වගන්තියේ, 36 වන වගන්තියේ, 37 වන වගන්තියේ හා 38 වන වගන්තියේ කාර්යය සඳහා "පිරිවැටුම් බද්ද" යන්නට මේ පනත යටතේ පනවන ලද හෝ දරන ලද යම් දඩුවමක් ඇතුළත් වේ.

*31 වන වගන්තියේ සිට 38 වන දක්වා වගන්තිවල කාර්යය සඳහා පිරිවැටුම් බද්දේ අර්ථය.*

(2) 33 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ සහතිකයක් හෝ 35 වන වගන්තිය යටතේ දැන්වීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන කවර හෝ අවස්ථාවක පැහැර හරිය තැනැත්තා වෙත ඒ වේලාවෙහි ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතු ය; එහෙත් පැහැර හැරිය තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

31. ගෙවීම් පැහැර හරිනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් පැහැර හරින්නාගේ සියලු වත්කම් විෂයයෙහි ප්‍රථම වැයබරක් විය යුතු ය :

*පිරිවැටුම් බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව.*

එසේ වුව ද—

(i) 33 වන වගන්තියේ විධිවිධානවලට අනුව තහනම් කරනු ලැබීමට පෙර පැහැර හරින්නා විසින් වටිනාකම සඳහා සද්භාවයෙන් මිල දී ගන්නකුට විකුණන ලද යම් වත්කම් වලට ඒ වැයබර ව්‍යාප්ත නොවිය යුතු ය; නැතහොත් බල නොපෑ යුතු ය;

(ii) නිශ්චල දේ පළ සම්බන්ධයෙන් වූ විට, දේ පළ තහනම් කරන ලද දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව ලියාපදිංචි කරන ලද බදුකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් පිරිවැටුම් බද්දට නොලැබිය යුතු ය; තවද,

(iii) චංචල දේපළ සම්බන්ධයෙන් වූ විට, කාර්තු හතරක කාලයක් සඳහා පිරිවැටුම් බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා ගත යුතු කාර්තු හතරක් පමණක් සඳහා වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇතිකර ගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

32. (1) යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට පෙර—

*පැහැර හරින්නා වෙත කරනු ලබන දැන්වීම.*

(අ) ඒ බද්දේ විස්තර; සහ

(ආ) ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව

සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලක්න් වූ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) බද්ද අය කරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට විරුද්ධව නිසි කාලසීමාව ඇතුළත පැහැර හරින්නා විසින් අභියාචනා කර නොමැති නම්, ඔහු විසින් ඒ දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුළත දී එසේ අය කරනු ලබන බද්දට යම් විරෝධතාවයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තව ද, 20 වන වගන්තියෙහි විධිවිධාන වල කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම විරෝධතාවයන් සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණ දිය යුතු අතර ඒ තීරණය (3) වන උපවගන්තියට යටත්ව අවසානාත්මක විය යුතු ය.

(3) ඒ පැහැර හරින්නා විසින් කොමසාරිස් ජනරාල්වරයාට (2) වන උපවගන්තියේ සඳහන් විරෝධතාව දැක්වීම පැහැර හැර ඇති අවස්ථාවක, 33 වන වගන්තිය සහ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයේ දිනයේ සිට නැතහොත් 35 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක දිනයේ සිට දවස් තිහක කාල සීමාවක් ඇතුළත, අය කරනු ලැබූ බද්දට විරෝධතාව යක් ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

තහනම් කොට විකිණීමෙන් පිරිවැටුම් බද්ද අයකර ගැනීම.

33. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ කාර්ය යන් සඳහා බදු එකතු කරන්නන් ලෙස තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) යම් පිරිවැටුම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැර ඇති තැනැත්තා ගේ නම ද අතුළත් සහතිකයක් දිසාපතිවරයකු වෙත හෝ උප දිසාපතිවරයකු වෙත හෝ පිස්කල්වරයකු වෙත හෝ නියෝජ්‍ය පිස්කල්වරයකු වෙත හෝ බදු එකතු කරන්නකු වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැර හැරි තැනැත්තාගේ චංචල දේපළ තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගේ බද්ද අයකර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට බලය ලැබිය යුතු වන් හැර, එසේ අය කරන ලෙස ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) ඉතාමත් යෝග්‍ය යැයි එකී නිලධරයා කල්පනා කරන ආකාරයකට එකී තහනම සිදු කළ යුතු අතර එලෙස තහනමට ගත් දේපළ, පැහැර හැරිය තැනැත්තා විසින් අය කිරීම් හා ගාස්තු ගෙවීමට යටත් ව, දින පහක කාලයක් තබා ගත යුතු ය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින පහ ඇතුළත ගාස්තු සහ අයකිරීම් ද සමග නොගෙවුවහොත් දිසාපතිවරයා, උප දිසාපතිවරයා, පිස්කල්, නියෝජ්‍ය පිස්කල් හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(ඇ) එම විකිණීමෙන් ලැබෙන මුදල්—

(i) පළමුව, දේපළ තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු හා අයකිරීම් ගෙවීම සඳහා ද;

(ii) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා ද යෙදිය යුතු ය. ශේෂයක් වේනොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(3) තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු නොලැබුව ද මේ වගන්තිය යටතේ පැහැර හරින්නකුට විරුද්ධව නඩු කටයුත්තක දී බදු එකතු කරන්නකු විසින් දරන ලද යුක්ති සහගත වියදම්, ඔහු විසින් යම් පැහැර හරින්නකුගෙන් අයකර ගැනීම නිත්‍යානුකූල වන්නේ ය. මුදල් තහනමට ගනු ලැබූ අවස්ථාවක, එවැනි යුක්ති සහගත වියදම් එසේ තහනමට ගනු ලැබූ මුදලින් පළමුව හිලව් කරනු ලැබිය යුතු ය.

(4) යම් පිරිවැටුම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තා වූ ද (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අය කර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරි තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි හෝ යම් දිස්ත්‍රික්කයක් විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ විසින් ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ හෝ නම නැතහොත් නම් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින්, ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල් සලකන ඉන් යම් කොටසක් හෝ තහනම් කොට විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක් ඇති වගන්ති වල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "චංචල දේපළ" යන්නට පිරියත සහ යන්ත්‍ර ඇතුළත් විය යුතු ය.

34. (1) නොගෙවා පැහැර හැරිය බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම පැහැර හැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර එවිට,

අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය.

එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඈ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකි ය:

එසේ වුවද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහේස්ත්‍රාත්වරයා විසින් සලකා බැලීම, විභාග කිරීම හෝ නිරණය කිරීම සඳහා මේ වගන්තියෙහි කිසිවකින් බලය පවරනු ලැබීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද පැහැර හැරිය තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා පැහැර හැරිය තැනැත්තා බන්ධනාගාරගත කිරීමකට නියම කරනු ලැබුවා වූ ද යම් අවස්ථාවක ඒ දඩ මුදල ගෙවීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් කල් දිය හැකි ය. නැතහොත් ඒ මුදල වාරික මඟින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උපවගන්තිය යටතේ කල් දීමෙහි හෝ (3) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල් දීමෙහි වූ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි ය. තව ද පැහැර හැරිය තැනැත්තාට එලෙස ඇප දීමට නියම කළ විටක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ ගෙවීම් වාරික මඟින් ගෙවීමට නියම කරනු ලැබ තිබිය දී ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු කටයුතු පැවරිය හැකි ය.

ස ආදියෙන් වැටුම් ද අය කර නීම.

35. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්ද නොගෙවා පැහැර හැර ඇත්තා වූ ද—

(අ) යම් තැනැත්තකු, පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ආ) යම් තැනැත්තකු, පැහැර හරින්නා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා නැතහොත් ඔහු වෙනුවෙන් මුදල් තබා ගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඇ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා වෙන යම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඈ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන් කිසි තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ද අවස්ථාවක, නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු) ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දිය හැකි ය. ඒ දැන්වීම ලැබූ දිනයෙහි දී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල්වලට ද දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත් වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ ද සම්බන්ධතාවක් ඇති අන් සියලු තැනැත්තන්ගේ ද බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තව ද යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟ වීමක කුමර විධිවිධානයක් තිබුණ ද සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ඒ ගෙවීම සම්බන්ධයෙන් වගකීමෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දැන්වීමක් දෙනු ලැබූ අවස්ථාවක (1) වන උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට ඔහු විසින් ඒ කාල සීමාව ඉකුත් වීමෙන් දහහතර දිනක් ඇතුළත ඒ කරුණු දන්වා කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ අවස්ථාවක (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, නැතහොත් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් අඩු කරගනු ලැබ හෝ අඩු කර ගැනීමට හැකිව තිබී ඒ බද්ද හෝ ඉන් කොටස (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාල සීමාව ඉකුත් වීමෙන් දින දහ හතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම් ඒ තැනැත්තා ද ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ...කම්, කළමනාකරු හෝ ...

ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පෞද්ගලිකව වග කිව යුතු ය. ඒ මුදල මේ පනතින් සලස්වනු ලැබූ සෑම මාර්ගය කින්ම අවස්ථාවෝචිත පරිදි ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අය කරගත හැකි ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හරින්නා" යන යෙදුමට නොගෙවා පැහැර හැරිය තැනැත්තකුගේ අනුයෝජිතයකු ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම් ඔහු විසින් ගෙවිය යුතු විය හැකිව තිබූ බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. තව ද එබඳු අවස්ථාවකට එම විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හරින්නා" යන යෙදුමෙන්—

(අ) නැසීගිය තැනැත්තකුගේ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ආ) නැසීගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාර ගන්නා හෝ එබන්දකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නා වූ යම් තැනැත්තෙක්; හෝ

(ඇ) නැසීගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ තැනැත්තෙක්

අදහස් වේ.

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන් ගෙන් පිරිවැටුම් බදු අය කර ගැනීම.

36. (1) යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබූ පිරිවැටුම් බදු නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ආසන්න බව හෝ එසේ බැහැර යෑමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක එකී බද්දේ විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත, එය ලැබුණ විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයට ඇප තැබීම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යෑම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරන වේලාවෙහි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ ලියාපදිංචි කරනු ලැබූ ලිපියක් තැපෑලෙන් යැවීමෙන් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් එවැනි යම් නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන් මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත නොවිය යුතු ය.

(3) බදු ගෙවූ බවට හෝ බදු ගෙවීම සඳහා ඇප තැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම නැතහොත් පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුට ඒ බදු මුදල ගෙවීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතු ය.

(4) යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට ඒ පොලිස් නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ගෙවනු ලැබිය යුතු ය.

බදු අය කර ගැනීමේ මාර්ග මගින් එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම.

37. මේ පනත යටතේ යම් තැනැත්තකුගෙන් අය විය යුතු සම්පූර්ණ පිරිවැටුම් බද්ද මේ පනතේ සලසා ඇති විධිවිධාන යටතේ අයකර ගත නොහැකි බව හෝ නොහැකි විය හැකි බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් 34 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණ ද ඒ නොතකා එසේ නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් අය කර ගැනීම සඳහා මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ බදු අය කර ගැනීමේ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

පිරිවැටුම් බදු අය කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය.

38. යම් තැනැත්තකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ අය විය යුතු පිරිවැටුම් බද්ද අය කර ගැනීමේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම.

39. (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පිරිනැමුණු හෝ පැවරුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබූ සෑම තක්සේරුකරුවකු විසින් ම ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

## XIII වන පරිච්ඡේදය

### විවිධ කරුණු

දැන්වීම් අත්සන් කිරීම හා භාරදීම.

40. (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ තක්සේරුකරුවකු විසින් දියයුතු සෑම දැන්වීමක ම අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ හෝ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමක් ම,

කොමසාරිස් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි නිසි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර තිබුණහොත්, වලංගු විය යුතු ය.

(2) මේ පනත ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක් ම, පුද්ගලිකව භාර දීමෙන් හෝ, යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිටි වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාළ වන අවුරුද්ද ඇතුළත ඔහු ව්‍යාපාරයේ නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාර දීමෙන් නැතහොත් තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත භාර දිය හැකි ය:

එසේ වුව ද 13 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ වූ තක්සේරු කිරීමේ දැන්වීමක් පුද්ගලිකව හෝ ඉහත සඳහන් කරනු ලැබූ යම් ස්ථානයකට ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යැවීමෙන් භාර දිය යුතු ය.

(3) තැපෑලෙන් යවනු ලැබූ දැන්වීමක් තැපෑලට ගනවන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයෙහි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තැපෑලෙන් භාර දීම ඔප්පු කිරීමේ දී, දැන්වීම ඇතුළත් ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(5) මේ පනතේ කාර්යය සඳහා වූ යම් දැන්වීමක් හෝ සහතිකයක් හෝ දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නම යයි සලකනු ලැබිය යුතු නමක් එවැනි යම් දැන්වීමක මුද්‍රණය කර හෝ අත්සන් කර හෝ තිබේ ද නැතහොත් එවැනි යම් සහතිකයක අත්සන් කර තිබේ ද ඒ සෑම නමක් ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

තක්සේරුවල වලංගු භාවය.

**41.** (1) මේ පනතේ විධිවිධානවලට අනුකූල යයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක් එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැලපේ නම් සහ එමගින් තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ බලපෑමක් ඇති වී තිබෙන්නා වූ හෝ තැනැත්තා පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව එහි නම් කර තිබේ නම් එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදුවිය යුතු ය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම ආදායම් බදු අයකර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථා පරිදි භාර දී ඇත්නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම ඒ දැන්වීමේ ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක—

(අ) බදු අය කරනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළ පත් නාමය පිළිබඳව හෝ පිරිවැටුම් ප්‍රමාණය පිළිබඳව හෝ අය කරනු ලැබූ පිරිවැටුම් බදු ප්‍රමාණය පිළිබඳව හෝ වරදක් තිබීම; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනසක් තිබීම

ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතු ය.

42. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, සාම නිලධරයකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිහිපයක් ඉටු කළ හැකිය:— ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය.

(අ) මේ පනත යටතේ වූ යම් කටයුත්තක් සඳහා ප්‍රයෝජනවත්තේ යයි හෝ කටයුත්තට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන යම් ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ ඒවා සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම;

(ආ) එබඳු ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම;

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුතුවලට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන, වෙනත් යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තවද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම්වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම්වලට අදාළ විය හැකි තාක් දුරට අදාළ විය යුතු ය.

මේ උපවගන්තියේ "සාම නිලධරයා" යන්නෙහි අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය දීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වීමට තුඩු දුන් කරුණු සටහන් ගත කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් යම් තැනැත්තකුගෙන් තහනමට ගත ලබන අවස්ථාවක එම නිලධරයා විසින් තහනමට ගනු ලැබ ඇති ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල නිශ්චිත විශයෙන් සඳහන් කෙරෙන අවගනාක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(4) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකිතාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල ඒ නිල ධරයා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කිරීමට ඇති බලය.

43. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිල ධරයකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි ය:—

(අ) මෙම පනතේ විධිවිධාන පිළිපදිනු ලැබ තිබේ දැයි තීරණය කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළුවීම සහ පිරික්සීම;

(ආ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් සොයා ගනු ලැබිය හැකි යම් භාජනයක් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම සහ එහි දී සොයා ගනු ලබන යම් භාණ්ඩ පිළිබඳ දේපළ ලැයිස්තුවක් සෑදීම;

(ඇ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම හා පිටපත් හෝ උධෘත ගැනීම;

(ඈ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් සන්තකයට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම;

(ඉ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ මුදල් වහාම ගණන් කොට ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම;

(ඊ) මේ පනත යටතේ වූ කරුණු සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් සැපයීමට බලය ඇති යම් තැනැත්තකු ඒ ස්ථාන යේ හෝ ගොඩනැගිල්ලේ සිටි සොයා ගනු ලැබූ විට, ඒ තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම;

(උ) තමා යෝග්‍ය යයි අදහස් කරන පරිදි, තනිව හෝ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී මේ පනතේ කරුණු සම්බන්ධ යෙන් එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක සිට තමා විසින් සොයා ගනු ලැබූ සෑම තැනැත්තකුම පරීක්ෂා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල් ලක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක, එම නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය, වාර්තාව හෝ ලිය විල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකි තාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල ඒ නිලධරයා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

44. පිරිවැටුම් බද්ද අය කළ හැකි නිෂ්පාදකයකු නොවන සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී තමා එළඹුණු එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන්— පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින් ම වවුචරය පිළියෙල කොට නිකුත් කළ යුතු බව.

(අ) ඒ ගනුදෙනුවට එළඹුණු දිනය ;

(ආ) ඒ ගනුදෙනුවේ ස්වභාවය ;

(ඇ) ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ලැබුණ හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය ; සහ

(ඈ) ඒ ගනුදෙනුවලට ඇතුළත් වූයේ යම් තැනැත්තකු සමග ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය

දක්වමින් වවුචරයක් පිළියෙල කිරීම හෝ පිළියෙල කරනු ලැබීමට සැලැස්වීම හෝ කළ යුතු ය. ඒ ගනුදෙනුවට එළඹුණේ යම්කිසි තැනැත්තකු සමග ද ඒ තැනැත්තාට ඒ වවුචරයේ මුල් පිට පත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ වවුචරය පිළියෙල කරන ලද්දේ යම්කිසි තැනැත්තකු විසින් ද, නැතහොත් යම්කිසි තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින්, ඒ වවුචරය පිළියෙල කරනු ලැබූ කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් ඒ වවුචරයේ පිටපත රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විවිධ ව්‍යාපාර සම්බන්ධයෙන් ගනුදෙනු වාර්තාගත කරනු ලැබිය හැක්කේ යම් ආකෘතියක් හා ආකාරයක් අනුව ද ඒ ආකෘතිය හා ආකාරය කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ හැකි ය.

45. (1) පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තමා එළඹුණු ගනුදෙනු සම්බන්ධයෙන් එක් එක් කාර්තුව වෙනුවෙන් ගනුදෙනු පිළිබඳ ලේඛනයක් තබා ගැනීම හා පවත්වාගෙන යාම කළ යුතු ය. ගනුදෙනු පිළිබඳ ලේඛනය.

(2) යම් කාර්තුවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් තබා ගනු ලැබූ ගනුදෙනු පිළිබඳ ලේඛනය, ඔහු විසින් එම කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතු ය.

## XIV වන පරිච්ඡේදය

### සාදන්නන් ලියාපදිංචි කිරීම

46. (1) පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම සාදන්නකු විසින් ම තමා කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහු වෙත ලියාපදිංචි අංකයක් පවරනු ලැබිය යුතු ය : සාදන්නා ලියාපදිංචි කිරීම හා ඔහු විසින් වවුචර නිකුත් කිරීම.

එසේ වුව ද, එවැනි ලියාපදිංචි කිරීමක්, ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදනු ලැබූ යම් භාණ්ඩයක් ශ්‍රී ලංකාවට, ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හැර, ගෙන එන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට අවශ්‍ය නොවිය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ මෙහි මින් මතු "ලියා පදිංචි කළ සාදන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන (1) වන උපවගන්තිය යටතේ ලියා පදිංචි කරනු ලැබූ සෑම සාදන්නකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා, ඒ බද්ද ගෙවිය යුතු වන්නා වූ හා එළඹුණ එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන්—

(අ) තම නම, තැපැල් ලිපිනය හා තම ලියා පදිංචි අංකය ;

(ආ) මිලට ගන්නාගේ නම, තැපැල් ලිපිනය හා ලියා පදිංචි අංකය, තිබේ නම් ;

(ඇ) එක් එක් ගනුදෙනුවට එළඹෙන ලද දිනය ;

(ඈ) ගනුදෙනුවේ ස්වභාවය ;

(ඉ) පිරිවැටුම් බද්ද සඳහා යම් අයකිරීමක් කිරීමට පෙර එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් සපයන ලද බඩු ප්‍රමාණය සහ ලැබුණු හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය ; සහ

(ඊ) ඒ එක් එක් ගනුදෙනුවකට ආරෝපණය කළ හැකි පිරිවැටුම් බද්ද

දක්වමින් විවුවරයක් පිළියෙල කිරීම හෝ පිළියෙළ කරනු ලැබීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

ඒ ගනුදෙනුවට එළඹුණේ යම්කිසි තැනැත්තකු සමඟ ද ඒ තැනැත්තාට විවුවරයේ මුල් පිටපත නිකුත් කරනු ලැබිය යුතු අතර ඒ විවුවරය පිළියෙළ කරන ලද්දේ යම්කිසි තැනැත්තකු විසින් ද, නැතහොත්, ඒ විවුවරය පිළියෙළ කරන ලද්දේ යම්කිසි තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින්, ඒ විවුවරය පිළියෙළ කරනු ලැබූ කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් ඒ විවුවරයේ පිටපත රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතු ය.

ලියා පදිංචි කළ සාදන්නා විසින් කරනු ලබන අඩුකිරීම.

47. ලියා පදිංචි කළ සාදන්නකු විසින්, පිරිවැටුම් බදු ගෙවිය යුතු වූ තම භාණ්ඩ සෑදීමේ ව්‍යාපාරයේ දී පාවිච්චි කරනු ලැබූ භාණ්ඩ සඳහා වූ පිරිවැටුම් බද්ද ඇතුළත් වන යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යම් මුදලක්, යම් කාර්තුවක් තුළ දී, වෙනත් ලියා පදිංචි කළ සාදන්නකු වෙත ගෙවා ඇති අවස්ථාවක, එසේ ඇතුළත් කරන ලද පිරිවැටුම් බද්ද, මුලින් සඳහන් කරන ලද ලියා පදිංචි කළ සාදන්නා විසින් එම කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද—

(අ) ඒ ව්‍යාපාරයේ දී පාවිච්චි කරනු ලැබූ යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක්, තිරවුරු, ගොඩනැගිලි, වාහන හෝ වෙනත් මූලධන වත්කම් සම්බන්ධයෙන් වූ බදු සඳහා කවර හෝ අඩු කිරීමක් නොකළ යුතු ය ;

(ආ) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් කළ යම් ව්‍යාපාරයක දී හෝ වෙළෙඳ ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් හෝ බද්දෙන් නිදහස් කළ භාණ්ඩ සෑදීමේ දී හෝ පිරිවැටුම් බදු සඳහා කවර හෝ අඩු කිරීමක් නොකළ යුතු ය;

(ඇ) 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නියම කර ඇති පරිදි තමා විසින් එම භාණ්ඩ මිල දී ගනු ලැබූ සාදන්නාගේ වවුචරයක් ලබාගෙන තිබේ නම් මිස, කවර හෝ අඩු කිරීමක් නොකළ යුතු ය;

(ඈ) ලියා පදිංචි කළ සාදන්නකු වශයෙන් ලියා පදිංචි කිරීමේ දිනයට කලින් ගෙවූ යම් මුදලකට ඇතුළත් කරන ලද යම් පිරිවැටුම් බද්දක්, පිරිවැටුම් බද්ද අයකර ගනු ලැබීමට එබඳු ලියා පදිංචි කළ සාදන්නකු යටත් වූ කාර්තුව සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ බද්දෙන් අඩු කර ගැනීමට ඉඩ දිය යුතු ය;

(ඉ) එම කාර්තුව සඳහා ගෙවිය යුතු බද්ද සම්බන්ධයෙන් වූ එවැනි අඩු කිරීමක් පිළිබඳ යම් අතිරික්තයක් ආපසු නොගෙවිය යුතු නමුදු එය තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලබන අතර සෙස්ස එපරිද්දෙන් ම විය යුතු ය.

48. 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ සාදන්නකු විසින් ප්‍රධාන රේගු අයකැමි වෙත පිරිවැටුම් බද්ද ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ ගෙවීම සම්බන්ධයෙන් ඒ සාදන්නාට නිකුත් කරන ලද ලදුපත ඉදිරිපත් කරනු ලැබූ විට, එම කාර්තුව සඳහා කොමසාරිස් ජනරාල්වරයාට ඔහු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන්, ගෙවන ලද මුදල වෙනුවෙන් අඩු කිරීමක් ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු අතර, අඩු කර ගත් ඒ මුදලින් එම කාර්තුව සඳහා ගෙවිය යුතු බද්ද අඩු කළ විට යම් අතිරික්තයක් වේනොත් එම අතිරික්තය ආපසු ගෙවනු නොලැබිය යුතු ය. එහෙත් එය තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලබන අතර සෙස්ස ඒ පරිද්දෙන්ම විය යුතු ය.

*ප්‍රධාන රේගු අයකැමි වෙත ගෙවන ලද පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැර.*

49. (1) කාර්තුවක අවසානයට පසුව එළඹෙන වර්ෂ තුන ඇතුළත ලියවිල්ලකින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් මගින්, ඒ කාර්තුව සඳහා යම් තැනැත්තකුගෙන් නියමාකාරව අය විය හැකි වූ පිරිවැටුම් බදු මුදලට වැඩියෙන් පිරිවැටුම් බද්ද ඔහු ගෙවා ඇති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ලෙස ඔප්පු කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවන ලද මුදල ආපසු ලබා ගැනීම සඳහා ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය:

*වැඩිපුර ගෙවන ලද පිරිවැටුම් බද්ද ආපසු ගෙවිය යුතු බව.*

එසේ වුව ද, අභියාචනය සඳහා වූ කාල සීමාව දීර්ඝ කිරීමට හෝ අඩු කිරීමට නැතහොත් අන්‍යාකාරයකින් නිර්වල වූ යම් විරෝධතාවක් හෝ අභියාචනයක් සබල කිරීමට නැතහොත් අවසාන හා තීරණාත්මක වී ඇති යම් තක්සේරුවක් හෝ වෙනත් කාරණයක් ප්‍රතිශෝධනය කිරීමට බලය පැවරීමට, මේ වගන්තියේ කිසිවක් ක්‍රියාත්මක නොකළ යුතු ය:

එසේ ම තවදුරටත්, වැඩිපුර ගෙවන ලද එම බද්ද, 47 වන වගන්තිය හෝ 48 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබ තිබේ නම් හෝ වෙනත් තැනැත්තකුගෙන් අයකර ගත් යම් මුදලකට ඇතුළත් කරනු ලැබ තිබේ නම් හෝ කිසිම ආපසු ගෙවීමක් නොකළ යුතු ය.

(2) 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වූ යම් මුදලක් ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව ගණන් බැලුවහොත් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතුවූ මුදලට වැඩි වන්නා වූ විට ඒ තැනැත්තා විසින් ඒ වැඩිපුර මුදල ගෙවනු ලැබ ඇති බව ලියවිල්ලකින් ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ලෙස ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, පූර්වෝක්ත (1) වන උපවගන්තියේ සඳහන් මුදල ගෙවන ලද කාර්තුව අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත ඒ හිමිකම් පෑම ඉදිරිපත් කරනු ලැබුවහොත් එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

(3) (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙහි මින් මතු මේ වගන්තියේ "අපනයනකරු" යනුවෙන් හඳුන්වනු ලබන යම් තැනැත්තකු විසින් යම් භාණ්ඩයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ විට දී සහ කොමසාරිස් ජනරාල්වරයා—

(අ) එම භාණ්ඩය ශ්‍රී ලංකාවේ නිපදවනු ලැබූ බවට හෝ සාදනු ලැබූ බවට හා එම භාණ්ඩය සාදන්නාගෙන් හෝ නිපදවන්නාගෙන් අපනයන කරන්නා විසින් මිල දී ගත් බවට ;

(ආ) එම භාණ්ඩය මිල දී ගැනීම සඳහා අපනයනකරු විසින් ගෙවනු ලැබූ මිල, ඒ සාදන්නාගේ හෝ නිපදවන්නාගේ ව්‍යාපාර පිරිවැටුමෙහි කොටසක් වන බවට ; සහ

(ඇ) ඒ සාදන්නා හෝ නිපදවන්නා විසින් ඔහුගේ ව්‍යාපාර පිරිවැටුම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම පිරිවැටුම් බද්ද ගෙවනු ලැබූ බවට

සෑහීමට පත් වුවහොත්, ඒ භාණ්ඩ සාදන්නා හෝ නිපදවන්නා විසින් ඒ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවනු ලැබූ ව්‍යාපාර පිරිවැටුම් බද්ද සම්බන්ධව යම් මුදල් ප්‍රමාණයක්, ඒ භාණ්ඩය සඳහා අපනයනකරු විසින් ගෙවනු ලැබූ, ගැනුම් මිලට පැවරිය හැකි ද ඒ මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් අපනයනකරුට ගෙවිය යුතු ය.

(4) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ සාදන ලද හෝ නිපදවන ලද යම් භාණ්ඩයක සාදන්නා හෝ නිපදවන්නා අපනයනකරු වන්නා වූ සහ—

(අ) ඒ භාණ්ඩය, ඇත්ත වශයෙන්ම ඒ අපනයනකරු විසින් ශ්‍රී ලංකාවේදී සාදන ලද බවට හෝ නිපදවන ලද බවට ;

(ආ) ඒ භාණ්ඩය සෑදීමට හෝ නිපදවීමට උපයෝගී කරගනු ලබන අමුද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ඒ අපනයනකරු විසින් ගෙවන ලද මිල, ඒ අමුද්‍රව්‍ය මිලට ගනු ලැබූ වේ යම් සාදන්නකු හෝ නිපදවන්නකු විසින් ද ඒ සාදන්නා හෝ නිපදවන්නා විසින් ගෙවන ලද බව ; සහ

(ඈ) ඒ අමු ද්‍රව්‍ය උපයෝගී කරගනු ලබන තම ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඒ සාදන්නා හෝ නිපදවන්නා විසින් ඇත්ත වශයෙන්ම ගෙවන ලද බවට

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ භාණ්ඩය සෑදීමෙහි දී හෝ නිපදවීමෙහි දී උපයෝගි කරන ලද අමු ද්‍රව්‍යවලට ආරෝපණය කරනු ලැබිය හැකි පිරිවැටුම් බද්දේ මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අපනයනකරුට ගෙවනු ලැබිය යුතු ය.

(5) (3) වන හා (4) වන උපවගන්තිවල සඳහන් භාණ්ඩයක් අපනයනය කරනු ලබන්නේ යම් භාජනයක, දරනයක හෝ දවටනයක ද, එම උපවගන්තිවල විධිවිධානවල "භාණ්ඩය" සම්බන්ධයෙන් වූ සියලු සඳහන් කිරීම්, අවස්ථෝචිත පරිදි, එකී භාජනය, දරනය හෝ දවටනය සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වූවාක් මෙන් ඒ භාජනය, දරනය හෝ දවටනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(6) යම් භාණ්ඩයක් අපනයනය කිරීමෙන් පසු මාස තුනකට කලින් නොවන සේ ද මාස නවයක් නොඉක්මවන සේ ද එම භාණ්ඩයේ අපනයනකරු විසින්, (3) වන උපවගන්තිය යටතේ, හෝ (4) වන උපවගන්තිය යටතේ, ගෙවීමක් කරවා ගැනීම සඳහා ලියවිල්ලකින් ඉල්ලීමක් කරනු ලැබුවහොත් මිස, ඒ භාණ්ඩය සම්බන්ධයෙන් හෝ යම් භාණ්ඩයක් සහ එම භාණ්ඩය අපනයනය කරනු ලබන භාජනය, දරනය හෝ දවටනය සම්බන්ධයෙන් හෝ (3) වන උපවගන්තිය යටතේ, හෝ (4) වන උපවගන්තිය යටතේ, කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

## XV වන පරිච්ඡේදය

### ගෙවීම්වලින් පිරිවැටුම් බද්ද අඩු කිරීම

ගෙවීම්වලින් පිරිවැටුම් බද්ද අඩු කිරීම.

50. (1) ගිවිසුමට එළැඹියේ මේ පනත ක්‍රියාත්මක වීමට පෙර වුව ද නොවුව ද, යම් තැනැත්තකු විසින් තමා පාර්ශ්වයක්ව සිටින්නා වූ ගිවිසුමක් ප්‍රකාර හෝ ගිවිසුමකට පාර්ශ්වයක් වන්නා වූ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ ගිවිසුම ප්‍රකාර හෝ යම් ගෙවීමක් කරන ලද අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණයකට, ඒ ගෙවීමේ ප්‍රතිශතයක් විය යුතු පිරිවැටුම් බද්දක්, ඒ ගෙවීම කරන සෑම තැනැත්තකු විසින් ම ඒ ගෙවීමෙන් අඩු කර ගනු ලැබිය යුතු ය. තවද එසේ අඩු කර ගන්නා ලද බදු මුදල ඒ තැනැත්තාගෙන් ජනරජයට අය විය යුතු ණයක් විය යුතු අතර ඒ ණය මුදල වහා ම අයකර ගනු ලැබිය හැකි විය යුතු ය. නැතහොත් ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක් වේ ද ඒ පිරිවැටුම් බද්දට අමතරව ඒ ණය මුදල තක්සේරු කර ඒ තැනැත්තාගෙන් අයකර ගත හැකි ය:

එසේ වුව ද, ඒ ගිවිසුම ඉටු කිරීමෙහි ලා ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන්නේ නම් එවැනි අඩු කිරීමක් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව පිරිවැටුම් බද්ද අඩු කර ගනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින්—

(අ) ඒ අඩු කරගනු ලැබීම කරන ලද්දේ යම් තැනැත්තකුගේ ගෙවීමකින් ද ඒ තැනැත්තාට—

(i) එසේ ගෙවන ලද දළ මුදල් ප්‍රමාණය ;

(ii) එසේ අඩුකර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණ ; සහ

(iii) නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල

දැක්වෙන ප්‍රකාශයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ අඩුකර ගැනීම කරනු ලැබ දින හතක් ඇතුළත එසේ අඩුකර ගන්නා ලද මුදල—

(i) ගෙවීම කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ;

(ii) එසේ ගෙවන ලද දළ මුදල් ප්‍රමාණය ;

(iii) එසේ අඩුකර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණය ; සහ

(iv) නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල

දැක්වෙන ප්‍රකාශයක් සමග කොමසාරිස් ජනරාල්වරයාට යවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව පිරිවැටුම් බද්ද අඩුකර ගන්නා ලද්දේ යම් මුදලකින් ද ඒ මුදල යම් තැනැත්තකුගේ පිරිවැටුමට ඇතුළත්වන අවස්ථාවක, (2) වන උපවගන්තියට අනුකූලව ඒ මුදල සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් ඒ අඩු කර ගන්නා ලද බදු මුදල වශයෙන් ඒ ප්‍රකාශයේ දක්වා ඇති මුදල ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු බද්දට හිලව් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, “ නිවිසුම ” යන්නෙන්—

(i) කවර වූ හෝ ස්වභාවයක ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් වූ යම් නිවිසුමක් ;

(ii) (i) ඡේදයේ සඳහන් යම් නිවිසුමක් සම්බන්ධයෙන් වූ බඩු සහ සේවාවන් සැපයීම සඳහා වූ යම් නිවිසුමක් ; හෝ

(iii) (i) හෝ (ii) ඡේදයෙහි සඳහන් යම් නිවිසුමක් සම්බන්ධයෙන් වූ අනු නිවිසුමක්

අදහස් වේ.

(5) (1) වන උපවගන්තිය අනුව පිරිවැටුම් බද්ද අඩුකර ගැනීම පැහැර හරින හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත යම් පිරිවැටුම් බද්දක් (2) වන උපවගන්තිය යටතේ යවනු ලැබීම පැහැර හරින හෝ යම් තැනැත්තකු ගෙවීම පැහැර හරින ලද සේ සලකනු ලැබිය යුතු අතර පිරිවැටුම් බදු අයකර ගැනීමට අදාළ වන්නා වූ මේ පනතේ විධිවිධාන එවැනි පැහැර හැරීමක් සම්බන්ධයෙන් ඒ ආකාරයෙන්ම අදාළ විය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් අඩු කිරීමක් කරන ලද හෝ (2) වන උපවගන්තිය අනුව යම් මුදල් යැවීමක් කර ඇති හෝ යම් තැනැත්තකු පිරිවැටුම් බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගේ සහ ප්‍රවේදිතාවයක් ඇති වෙනත් සියලුම තැනැත්තන්ගේ අධිකාරිය යටතේ ක්‍රියා කරන ලද සේ සල කනු ලැබිය යුතු අතර, සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක විධිවිධාන නොතකා, ඒ අඩුකිරීම හෝ මුදල් යැවීම සම්බන්ධයෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(7) යම් තැනැත්තකු ගිවිසුම් දෙකකට හෝ ඊට වැඩි ගණනකට ඇතුළුව ඇත්තා වූ ද, තක්සේරුකරු විසින්, ඒ ගිවිසුම්වල ස්වභාවය සහ පාර්ශ්වයන් කෙරෙහි සැලකිල්ල දක්වා, ඒ ගිවිසුම් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් කරන ලද ගෙවීම් ලබන තැනැත්තා වූ කලී එකම තැනැත්තාම හෝ ඔහුගේ අනුයෝජිතයා බව කල්පනා කරන්නා වූ ද අවස්ථාවක, ගෙවන ලද හෝ ගෙවිය යුතු මුදල (1) වන උපවගන්තියේ කාර්ය සඳහා එකතු කරනු ලැබිය යුතුය.

## XVI වන පරිච්ඡේදය

### වැරදි සහ දණ්ඩන

**51.** (අ) 57 වන වගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම දීමට නියමිත තැනැත්තකුව සිටිය දී එම දිවුරුම නොදී මේ පනත යටතේ කටයුතු කරන්නා වූ ; හෝ

රහස්‍යතාව කඩකිරීම සහ වෙනත් කාරණා වැරදි වන බව.

(ආ) 57 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් කටයුතු කරන්නා වූ ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන වලින් කිසිවක් කඩ කරමින් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළොඹවන්නා වූ ; හෝ

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

**52.** (අ) මේ පනතේ විධිවිධාන අනුව අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට හෝ වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් හෝ යම් අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ ; හෝ

වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන.

(ආ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නා වූ ;

(ඇ) මේ පනත යටතේ යම් අසත්‍ය වාර්තාවක් කරන්නා වූ හෝ මේ පනත යටතේ සපයනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ

සහ එමගින් පිරිවැටුම් බද්ද ගෙවීම මග හරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකුට ඒ බද්ද ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට හෝ ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(i) වරද කරනු ලැබූ වේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත ද ඒ කාර්තුව සඳහා අවස්ථෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ යටත් ව සිටින්නා වූ ද මග හැරියාවූ හෝ මග හැරීමට තැත් කළා වූ ද බදු මුදල් ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලකින්; සහ

(ii) රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලකින්

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන.

53. (අ) 9 වන වගන්තියේ හෝ 44 වන වගන්තියේ හෝ 45 වන වගන්තියේ හෝ 46 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්තිවල හෝ 50 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ආ) 9 වන වගන්තිය හෝ 17 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැනවීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ඇ) 9 වන වගන්තිය හෝ 17 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සැහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ; හෝ

(ඈ) පිරිවැටුම් බද්දට තමා යටත් වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ; හෝ

(ඉ) 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට ඕනෑකමින් ම බාධා කරන්නා වූ හෝ කොමසාරිස් ජනරාල්වරයා හෝ වෙනත් යම් නිලධරයකු ප්‍රමාද කරන්නා වූ; හෝ

(ඊ) මේ පනතේ විධිවිධානවලට විරුද්ධව කටයුතු කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

**වැරදි සමථයට පත් කිරීම.**

54. 51 වන වගන්තිය, 52 වන වගන්තිය හෝ 53 වන වගන්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස් ජනරාල්වරයා විසින් සමථයට පත් කළ හැකි ය. තව ද ඒ යටතේ වූ යම් නඩුකටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයට පත් කිරීම ඔහු විසින් කළ හැකි ය.

**නඩු පැවරීම කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව.**

55. 51 වන වගන්තිය, 52 වන වගන්තිය හෝ 53 වන වගන්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය යුතු ය.

## XVII වන පරිච්ඡේදය

### පරිපාලනය

**පරිපාලනය.**

56. (1) VII වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා මේ පනතේ පරිපාලනය භාරව සිටින්නේ ය.

(2) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති යම් බලයක් ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කරන කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට බලය දෙනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනත මගින් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබූ යම් බලයක් කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

**නිල රහස්‍යභාවය.**

57. (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා හැර මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහායවීම කළ යුතු ය. තවද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් නො දැන්විය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන තිබිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ සෑම තැනැත්තකු විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර, සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ හැකි ය.

(3) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට, මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රිය වෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක්, ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරව් කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ හෝ එවැනි වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය නම් ඒ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට දැනුම් දීම කළ හැකි අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත සපයනු ලැබූ හෝ තම සන්තකයෙහි ඇති, යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක්, එය ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය:

එසේ වුව ද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තා හෝ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය:

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටක දී කොමසාරිස් ජනරාල්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්ය කිරීමට අවශ්‍ය විය හැකි වාර්තා හෝ ලේඛන ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර දිය හැකි ය. විගණකාධිපතිවරයා හෝ මේ උපවගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකු වශයෙන් (2) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

58. මේ පනතේ සියලු කාර්ය හෝ ඉන් කිසිවක් සඳහා භාවිත කළ යුතු ආකෘති පත්‍ර සහ ගනුදෙනු පිළිබඳ ලේඛනය කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ය. තව ද, එසේ නියම කරන ලද යම් ආකෘති පත්‍ර හෝ ගනුදෙනු පිළිබඳ ලේඛනය කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය. නැතහොත් එසේ නියම කරන ලද ආකෘතිපත්‍ර හෝ ගනුදෙනු පිළිබඳ ලේඛනයක් වෙනුවට වෙනත් ආකෘතිපත්‍ර හෝ ගනුදෙනු පිළිබඳ ලේඛනයක් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ආදේශ කරනු ලැබිය හැකි ය. ආකෘති පත්‍ර සහ ගනුදෙනු පිළිබඳ ලේඛනය.

## XVIII වන පරිච්ඡේදය

### අර්ථ නිරූපණය

59. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"අනුයෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක මෙහෙයවීම, පාලනය හෝ කළමනාකරණය ඇතිව සිටින තැනැත්තකු අදහස් වේ;

"භාණ්ඩය" යන්නට යම් බඩු, ද්‍රව්‍ය හෝ යම් කෘෂිකාර්මික හෝ උද්‍යාන නිෂ්පාදන ඇතුළත් වේ;

"තක්සේරුකරු" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් තක්සේරුකරුවකු අදහස් වේ;

"බලය ලත් නියෝජිතයා" යන්නෙන්,—

(1) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද—

(අ) ඕනෑම අවස්ථාවක දී—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන්නා වූ ද;

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ ගණකාධිකාරිවරයකු වන්නා වූ ද;

(iii) නීතිඥවරයකු වන්නා වූ ද; හෝ

(iv) අදාළ තැනැත්තා විසින් නිතිපතා සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයකු වන්නා වූ ද;

(ආ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ඔහුගේ ඥාතියකු වන්නා වූ ද;

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වර යකු වන්නා වූ ද;

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වන්නා වූ ද;

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නා වූ; නැතහොත්

(2) බලය දීමේ ලියවිල්ලෙහි සඳහන් කාර්තුවට අදාළ කාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබූ සහ සමාගම් (විගණක) නියෝග යටතේ විගණක වරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද

යම් පුද්ගලයෙක් අදහස් වේ;

"පුද්ගල මණ්ඩලය" යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක්, යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක්, සංගමයක්, හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක්, යම් හවුල් ව්‍යාපාරයක් සහ යම් ඒකාබද්ධ හින්දු පවුලක් අදහස් වන අතර, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපාරයක් ඊට ඇතුළත් වේ;

"ව්‍යාපාරය" යන්නට යම් කර්මාන්තයක්, වෘත්තියක්, රැකියා වක්, කෘෂිකාර්මික ව්‍යාපාරයක්, තුරඟතරඟ පැවැත්වීම හෝ සමාගමක් විසින් වාණිජ ස්ථාන කුලියට දීම හෝ සාදන්නකුගේ ව්‍යාපාරයක් හෝ යම් ගනුදෙනුවක් හෝ කරන ලද සේවාවක් වෙනුවෙන් කොමිස් හෝ ගාස්තු වක් අයකර ගන්නා වූ යම් තැනැත්තකුගේ ව්‍යාපාරයක් හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරයක් හෝ වෙළෙඳ ස්වභාවය ඇති සෑම ප්‍රයත්නයක් හා ආයතන යක් ද ඇතුළත් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබූ දේශීය ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ;

" කොමසාරිස් ජනරාල්වරයා " යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරනු ලැබූ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර, කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයක් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ කොමසාරිස්වරයකු සහ නියෝජ්‍ය කොමසාරිස්වරයකු ඊට ඇතුළත් වේ;

" සමාගම " යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ අන් කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් සමාගමක් අදහස් වේ;

" නියෝජ්‍ය කොමසාරිස්වරයා " යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබූ දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු අදහස් වේ;

" බැහැර කරන ලද භාණ්ඩය " යන්නෙන්, 8 වන වගන්තිය යටතේ බැහැර කරන ලද භාණ්ඩයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද යම් භාණ්ඩයක් අදහස් වේ;

" පොල්මඃකරු " යන්නෙන්, මිය ගිය තැනැත්තකුගේ පොල්මඃ කරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු අදහස් වන අතර—

(අ) මිය ගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය ලබා ගන්නා හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත් වන යම් තැනැත්තකු;

(ආ) මිය ගිය තැනැත්තකුගේ මුදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයකට ඉල්ලුම්කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම ඇති යම් තැනැත්තකු; හෝ

(ඇ) භාරය පිහිටුවන තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයෙන් පිහිටුවනු ලැබූ භාරයක් යටතේ ක්‍රියා කරන භාරකරුවකු

එයට ඇතුළත් වේ;

" අශක්‍යතාවට පත් තැනැත්තා " යන්නෙන්, යම් බාල වයස්කරුවකු, උම්මත්තකයකු, මුග්ධයකු හෝ සිහිවිකල් තැනැත්තකු අදහස් වේ;

" පළාත් පාලන ආයතනය " යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"සාදන්නා" යන්නෙන්—

(අ) යම් භාණ්ඩයක් සාදන ;

(ආ) රසායනික ක්‍රියාවකින් හෝ අන්‍යාකාරයකින් යම් භාණ්ඩයක් එකලස් කරන නැතහොත් සම්බන්ධ කරන ;

(ඇ) යම් භාණ්ඩයක් විකිණීම පිණිස සුදුසු තත්ත්වයට සකස් කරන ;

(ඈ) නිරවශේෂයෙන් ම සහ කෙළින් ම පාරිභෝගිකයන්ට විකිණීමේ කාර්යය සඳහා, සිල්ලර ගබඩාවක නොවන යම් ගබඩාවක විකිණීම සඳහා අසුරන, බෝතලවලට පුරවන, පෙට්ටිවලට දමන, කෑබලිවලට කපන, පවිත්‍ර කරන, ඔප දමන, ඔතන, ලේබල් අලවන හෝ වෙනත් ඕනෑම ආකාරයකින් වෙළෙඳාම සඳහා සූදානම් කරන ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹ ඇත්තේ යම් ව්‍යාවසායක් සමග ද ඒ ව්‍යවසාය විසින් ශ්‍රී ලංකාවේ දී සාදනු ලබන යම් භාණ්ඩයක් ඒ ව්‍යවසායයෙන් විකිණීම සඳහා මිල දී ගන්නා හෝ ලබා ගන්නා ;

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක් ආනයනය කරන ;

(උ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක් ශ්‍රී ලංකාවට ගෙන එන

යම් තැනැත්තෙක් අදහස් වේ ;

"තැනැත්තා" යන්නට, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රිය හවුල්කරුවන් අතුරෙන්—

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති ; හෝ

(ආ) එවැනි ගිවිසුමක් නොමැති නම්, හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිව ම හෝ අනික් හවුල් කරුවන්ට ප්‍රමුඛව නමින් හෝ මූලකුරුවලින් සඳහන් කොට ඇති ; හෝ

(ඇ) ව්‍යාපාර නාම ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශයෙහි පළමුවෙන් නම් කොට

ඇති හවුල්කරු අදහස් වේ ;

"කාර්තුව" යන්නෙන් සෑම අවුරුද්දක ම ජනවාරි මාසයේ පළමු වන දිනයෙන්, අප්‍රේල් මාසයේ පළමු වන දිනයෙන්, ජූලි මාසයේ පළමු වන දිනයෙන් සහ ඔක්තෝබර් මාසයේ පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලය අදහස් වේ ;

"භාරකරු" යන්නට, යම් භාරකරුවකු, ආරක්ෂකයකු, දේපළ ආරක්ෂකයකු, කළමනාකරුවකු, අනුයෝජිතයකු හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය සතුව ඇති වෙනත් තැනැත්තකු ඇතුළත් වන නමුත් පොල්මඃකරුවෙක් ඊට ඇතුළත් නොවේ.

## XIX වන පරිච්ඡේදය

### 1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටස අදාළ වීම

**60.** 1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටස ව්‍යාපාර පිරිවැටුම් බදු පැනවීමේ දී 1981 නොවැම්බර් මස 13 වන දින හෝ ඉන් පසු ආරම්භ වන කාල සීමාවකට අදාළ නොවිය යුතු ය.

1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටස අදාළවීම.